බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2012 (2013)

(04) අභිධර්මය

(කාලය :පැය 03 යි.)

සැ.යු. : I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. i) සතර පරමාර්ථ නම් කරන්න.

....

....

....

....

(ලකුණු 02 යි)

ii) අභිධර්මයට අනුව සත්ත්වයන්ට පහළ වන්නාවූ සිත්, භූමි වශයෙන තුන් වැදෑරුම් ලෙස (ත්‍රෛභූමික සිත්) දැක්වෙයි. එම භූමි පිළිවෙළින් නම් කර, එක් එක් භූමියට අයත් සිත් සංඛ්‍යාව දක්වන්න.

....

....

....

(ලකුණු 02 යි)

iii) අහේතුක සිත් සංඛ්‍යාව දක්වා එම සිත් අහේතුක ලෙස හැඳින්වීමට හේතුව පැහැදිලි කරන්න.

....

....

....

(ලකුණු 03 යි)

iiv) "කර්මය" හා "කර්ම පථ" අතර වෙනස දක්වන්න.

....

....

....

(ලකුණු 03 යි)

v.) "උද්ධච්ච" සහ "කුක්කුච්ච" යන චෛතසික දෙකෙහි මූලික ලක්ෂණ පෙන්වා දෙන්න.

....

....

....

(ලකුණු 03 යි)

iv) රූපචාරී පළමු විපාක සිත නම් කරන්න.

....

....

....

(ලකුණු 03 යි)

vii) අකුසල චෛතසික අතර ඇති " ලෝභ ත්‍රිකයට" අයත් චෛතසික පිළිවෙළින් නම් කරන්න.

....

....

....

(ලකුණු 03 යි)

viii) අකුසල කාය කර්ම පිළිවෙළින් නම් කරන්න.

....

....

....

(ලකුණු 03 යි)

ix) "කෝලංකෝල" සෝතාපන්න පුද්ගලයා යනු කවරෙක් දැයි හඳුන්වන්න.

....

....

....

(ලකුණු 03 යි)

x) අකුසල වචී කර්ම පිළිවෙලින් නම් කරන්න.

....

....

....

(ලකුණු 03 යි)

බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2012 (2013)

(03) අභිධර්මය

කාලය පැ. 3 යි.

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

02. i. අභිධම්ම පරියාය සහ සුත්ත පරියාය අතර වෙනස්කම් පැහැදිලි කරන්න.
ii. මහායාන ආචාර්ව වාදය වූ යෝගාචාර සම්ප්‍රදායේ මූලික කරුණු ඇතුළත් වනසේ හැඳින්වීමක් කරන්න.
iii. ථෙරවාදී අභිධර්මසම්ප්‍රදායේ ඇතුළත් අභිධර්ම කෘති අතර ඇති "පුද්ගල පඤ්ඤත්තිප්පකරණය" පිළිබඳව විස්තරයක් කරන්න.

03. i. "සබ්බේ ධම්මා අනත්තාති" යන ගාථා පාඨයේ සරල අදහස දක්වා එහි "ධම්ම" යන වචනයේ මූලික ප්‍රභේද ඇතුළත් වනසේ අභිධර්මානුකූලව අර්ථ දක්වන්න.
ii. "උප්පාදො පඤ්ඤායති, වයෝ ප ඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති" යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
iii. මූලික කරුණු ඇතුළත් වනසේ විදර්ශනා භාවනාව පිළිබඳ හැඳින්වීමක් කරන්න.

04. i. කාමාවචර හා කුසල් සිත් සංඛ්‍යාව දක්වා එම සිත්වලින් පළමු සිත හා අවසාන සිත ලියන්න.
ii. කුසල් සිතක් " සෝමනස්ස සහගත" වීමට හේතුවන කරුණු පැහැදිලි කරන්න.
iii. කුසල් සිත්වල යෙදෙන "ඤාණ සම්ප්‍රයුක්ත" සහ " ඤාණ විප්‍රයුක්ත" යන ස්වභාවයන් පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න.

05. i. සෝභන රාශියේ චෛතසිකයන්ගේ මූලික ප්‍රභේද දක්වා ඒවාට ඇතුළත් වන චෛතසික සංඛ්‍යාව ලියන්න.
ii. විරති චෛතසික පිළිවෙළින් නම් කර ඒවා විරති ලෙස හැඳින්වීමට හේතුව පැහැදිලි කරන්න.
iii. විරති චෛතසික පදනම් කරගනිමින් සීලය පිළිබඳව විස්තරයක් කරන්න.

06. i. කර්මයෙන් කෙරෙන කෘත්‍ය සතර පිළිවෙළින් නම්කර එයින් දෙවැනි හා තෙවැනි ප්‍රභේද පිළිබඳව පැහැදිලි කරන්න.
ii. ප්‍රාණඝාත අකුසල කර්මය සම්පූර්ණ වීමට හේතුවන කරුණු දක්වමින් ඒ පිළිබඳව විස්තර කරන්න.
iii. පන්සිල් සුරැකීම පුද්ගල සංවර්ධනයට හා සමාජ සංවර්ධනයට හේතුවන අයුරු පෙන්වා දෙන්න.

07. i. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා පිළිවෙළින් නම්කර එයින් තෙවැන්නා පිළිබඳව මූලික ප්‍රභේද ඇතුළත් වනසේ හැඳින්වීමක් කරන්න.
ii. "සීලං නිස්සාය චත්තාරෝ සතිපට්ඨානෙ භාවෙය්‍යාථ" යන්න අර්ථ දක්වමින් පැහැදිලි කරන්න.
iii. මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිසංස පුද්ගල හා සමාජමය වශයෙන් වැදගත්වන ආකාරය පෙන්වා දෙන්න.

08. i. නීවරණ යන්න හඳුන්වා පංච නීවරණ පිළිළෙින් නම් කරන්න.
ii. පළමුවැනි නීවරණය පිළිබඳව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
iii. පුද්ගල සන්තානයේ පරිහානියට නීවරණ බලපාන ආකාරය නිදර්ශන සහිතව පෙන්වා දෙන්න.

09. i. උද්ධම්භාගිය සංයෝජන ධර්ම පිළිවෙළින් නම් කරන්න.
ii. " ක්ලේශ පරිනිර්වාණය" " ස්කන්ධ පරිනිර්වාණය" යන මූලික ප්‍රභේද දෙක පැහැදිලි කරමින් නිවන් අවබෝධය පිළිබඳව හැඳින්වීමක කරන්න.
iii. තදංග ප්‍රහාණය, විෂ්කම්භන ප්‍රහාණය, සමුච්ඡේද ප්‍රහාණය යන සංකල්ප ඇතුළත් වනසේ කෙලෙස් ප්‍රහාණය පිළිබඳව විස්තරයක් කරන්න.

* * *